**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2018**

---------------------------------------------------------------------

## 1.1 මතය

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

කොමිෂන් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා

කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම,වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කොමිෂන් සභාව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. 442,506,214 ක ඌණතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේදී ඌණතාවය රු. 391,794,823 ක් ලෙස වාර්තා විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌණතාවය රු. මිලියන 51 කින් හෙවත් සියයට 13 කින් වැඩි වීම සඳහා සේවක පාරිශ්‍රමික සංශෝධනය කිරීම නිසා සේවක වියදම රු. මිලියන 35 කින් වැඩි වීම සහ ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වියදම් රු. මිලියන 13 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සෙස් අරමුදලේ සහ වන්දි අරමුදලේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ කොමිෂන් සභාවේ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත පරිදි දක්වා ඇත.

| | 2018<br>රු. | 2017<br>රු. | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| <u>**සෙස් අරමුදලේ සහ වන්දි අරමුදලේ ආදායම්**</u> | | | |
| ලද සෙස් ආදායම | 250,704,350 | 264,026,238 | (5) |
| සෙස් අරමුදලේ ආයෝජන මත පොළිය | 264,406,422 | 245,603,792 | 7.6 |
| වන්දි අරමුදලේ ආයෝජන මත පොළිය | 39,829,392 | 36,329,850 | 9.6 |
| <u>**කොමිෂන් සභාවේ වියදම්**</u> | | | |
| සේවක වැටුප් | 130,974,645 | 108,259,916 | 21.0 |
| ඊ.පී.එෆ් සහ ඊ.ටී.එෆ් | 19,964,301 | 16,636,256 | 20.0 |
| සේවක පාරිතෝෂික | 13,045,173 | 3,490,950 | 273.7 |
| විශේෂ ගෙවීම් | 15,882,863 | 11,504,623 | 38.1 |
| ඉන්ධන ප්‍රතිපූරණය | 416,120 | 2,648,779 | (84.3) |

| | | | |
|---|---|---|---|
| සේවක වහාන දීමනා | 19,735,833 | 6,403,984 | 208.2 |
| **ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වියදම් - එකතුව** | 85,159,152 | 72,065,352 | 18.2 |
| • ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය | 48,933,373 | 46,675,368 | 4.8 |
| • මහ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 20,632,925 | 11,432,025 | 80.5 |
| • අධ්‍යාපන වැඩසටහන් | 3,636,294 | 3,473,587 | 4.7 |
| • ජාත්‍යාන්තර සාමාජිකත්ව ගාස්තු - අයි.ඕ.එස්.සී.ඕ | 3,529,660 | 2,908,967 | 21.3 |
| • ප්‍රසිද්ධිය සහ ප්‍රචාරණය | 233,800 | 84,843 | 175.6 |
| • වෙළඳපොල පරීක්ෂණ පිරිවැය | 8,167,459 | 7,476,822 | 9.2 |
| • විමර්ශනය සහ පරීක්ෂාකිරීමේ වියදම් | 25,641 | 13,740 | 86.6 |

අ. කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් 2018 ජනවාරි 22 දින පැවති 404 වැනි රැස්වීමේදී 2018 මාර්තු 01 දින සිට බලපැවෙත්වෙන පරිදි එක් එක් කාණ්ඩයේ කාර්ය මණ්ඩලවල වැටුප් තලවල මූලික පියවරෙන් සියයට 50 ක වැටුප් වැඩි කිරීමක් සඳහා අනුමැතිය ලබා දි තිබුණි. ඒ අනුව සේවක වැටුප්, ඊ.පී.එෆ් හා ඊ.ටී.එෆ් සහ විශේෂ ගෙවීම් ( එක් මසක මූලික වැටුප අවුරුද්දකට දෙවරක්) සමාලෝචිත වර්ෂය තුළදී වැඩි වී තිබුණි.

ආ. කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් 2018 ජනවාරි 22 දින පැවති 404 වැනි රැස්වීමේදී 2018 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි සහකාර අධ්‍යක්ෂක සහ ඊට ඉහළ තනතුරු සඳහා වන වාහන දීමනාව සංශෝධනය කර තිබුණු අතර එම දීමනාව කළමනාකරු, ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකරු, සහකාර කළමනාකරු, නිළධාරීන්, ජ්‍යෙෂ්ඨ විධායක ලේකම් සහ විධායක ලේකම් යන තනතුරු සඳහාද ලබා දීමට අනුමත කර තිබුණි. ඒ සමඟම කළමනාකරු සහ ඊට ඉහළ තනතුරු සඳහා ගෙවන ලද ඉන්ධන ප්‍රතිපූරණය කිරීම අහෝසි කර තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරු සහ ඊට ඉහළ තනතුරු සඳහා වන ඉන්ධන ප්‍රතිපූරණය සියයට 84 කින් අඩු වන විට, සේවක වාහන දීමනාව සියයට 208 කින් වැඩි වී තිබුණි.

ඇ. 2018 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වගකීම සුදුසුකම්ලත් ආයුගණකයකු විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19, ‘‘සේවක ප්‍රතිලාභ’’ මගින් නිර්දේශිත පුරෝකතන ඒකක ණය ක්‍රමය (Projected Unit Credit method) යොදා ගනිමින් ප්‍රථම වරට ගණනය කර තිබුණි. ඒම නිසා සේවක පාරිතෝෂික වියදම සමාලෝචිත වර්ෂය තුළදී වැඩි වී තිබුණි.

ඇ. ප්‍රාග්ධන වෙළඳපොල හා නිෂ්පාදන සංවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 48.9 ක් විය. එහි ප්‍රධාන වශයෙන් තැරැව්කරුවන්ගේ පසුපෙල කාර්යාල පද්ධතිය (Broker Back Office Systems) සහ ඇණවුම් කළමනාකරණ පද්ධතිය (Order Management System) සඳහා වැය කරන ලද රු. මිලියන 26.8 ක් හෙවත් සියයට 54.8 ක් ඇතුළත් විය. තවද, නිව්යෝර්ක්, නවසීලන්තය, ඔස්ට්‍රේලියාව, සිංගප්පූරුව සහ එංගලන්තයේ 2017 සහ 2018 වර්ෂවලදී පැවති ආයෝජක සංසදයන් වෙනුවෙන් රු. මිලියන 15.7 ක් හෙවත් සියයට 32.1 ක් වූ වැය කර තිබුණි.

ඉ. 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 14 ආ (2) අ වගන්තිය ප්‍රකාරව ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු කරගෙන යාම සඳහා එමඟින් බලය දී තිබේ. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු සඳහා මුළු වියදමෙන් සියයට 18 ක් වැය කර තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ එය සියයට 17ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | 2018 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අධීක්ෂණ අංශයේ අධීක්ෂණය යටතේ ආයතන 91 ක් පැවතුණි. මෙම අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී ආයතන 49 ක ස්ථානීය පරීක්ෂණ (On-site inspections) පැවැත්වීම සඳහා සැලසුම් කර තිබුණු අතර විශේෂ ස්ථානීය පරීක්ෂණ 5 ක් හැර ආයතන 28 ක ස්ථානීය පරීක්ෂණ සමාලෝචිත වර්ෂය තුළදී අවසන් කර තිබුණි. | අධීක්ෂණ අංශය විසින් ස්ථානීය පරීක්ෂණ සිදු කිරීමේදී අවදානම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි. ඉහළ අවදානමක් ඇති ආයතනවල ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම කෙරෙහි 2018 වර්ෂයේදී අවධානය යොමු කරන ලදී. | සැළසුම් කළ පරිදි පරීක්ෂණ පැවැත්වීම. |
| ආ | සමාලෝචිත වර්ෂය තුළදී විමර්ශන අංශය විසින් හසුරුවන ලද සිද්ධීන් 33 ක් අතුරින් 2019 අගෝස්තු 22 වන විට සිද්ධීන් දහයක විමර්ෂණ සම්පූර්ණ කළ තිබුණු අතර සම්පූර්ණ කරන ලද සිද්ධීන් හතරක වාර්තා | එකඟ වේ. | සියලු හිඟ විමර්ශන අවසන් කිරීමට ප්‍රමුඛතාව ලබා දීම. |

| | | | |
|---|---|---|---|
| | කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. 2013 ජුලි මාසයේ සිට 2018 පෙබරවාරි මාසය දක්වා කාලය තුළදී ලියාපදිංචි කළ අනෙකුත් සිද්ධීන් 23 හි විමර්ශන කටයුතු කෙරීගෙන යමින් පැවතුණි. | | |
| ඇ | මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණය (Central Counter Party Mechanism - CCP) ක්‍රියාත්මක කිරීමේ පියවරක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන භාරදීමට එරෙහිව ගෙවීම් (Delivery Versus Payment - DvP) ක්‍රමය 2018 වර්ෂයේ පළවන කාර්තුව අවසානයේදී සම්පූර්ණ කිරීමට සැළැසුම් කර තිබූ අතර එය 2019 වර්ෂයේ පළවන කාර්තුව දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, භාරදීමට එරෙහිව ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කටයුතු 2019 අගෝස්තු 22 වන විටත් කෙරීගෙන යමින් පැවතුණි. | DvP ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වන පද්ධති වෙනස්වීම් සහ යටිතල පහසුකම් යාවත්කාලීන කිරීම් 2019 වර්ෂය අවසන් වන විට දී අවසන් කිරීමට සහ ඉන් මාස හයකට පසු එය ක්‍රියාත්මක කළ හැකි බව කොළඹ කොටස් වෙළඳපොල විසින් දැනුම් දී තිබේ. | DvP ක්‍රියාවට නැංවීම සැළසුම් කළ පරිදි සිදු කිරීම සහ ඒකාබද්ධ මධ්‍යම පාර්ශ්වීකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සාකච්ඡා කිරීම. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ | 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 43 (2) වගන්තිය ප්‍රකාරව, පත් කරන ලද නිලධරයන්ට සහ සේවකයින්ට කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු ලබන ආකාරය හා අනුප්‍රමාණ අනුව වැටුප් ගෙවිය යුතු අතර, කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතුය. තවද, 1992 මාර්තු 31 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව, වෙනත් රජයේ රෙගුලාසි සලකා බැලීමෙන් තොරව සිය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ ඔවුන්ගේ වැටුප් හා අනෙකුත් දීමනා නියම කිරීම සඳහා කොමිෂන් සභාවට නිදහස තිබේ.<br><br>ඒ අනුව, කාර්ය මණ්ඩලයේ වැටුප් පරිමාණයන් සහ විශේෂ ජීවන දීමනාව, මාසික දීමනාව, කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම්, කාර්ය මණ්ඩල වාහන දීමනාව හා විශේෂ ගෙවීම් වැනි අනෙකුත් දීමනා කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වරින් වර තීරණය කර තිබුණි.<br><br>කෙසේ වෙතත්, 2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේ (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව කොමිෂන් සභාව සිය කාර්ය මණ්ඩලයට ලබා දෙන වැටුප් හා | කොමිෂන් සභාවේ කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා නිසි පරිදි සුදුසුකම් ලත් හා මනා පෞරුෂයකින් හෙබි පළපුරුදු කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන රඳවා ගත යුතුය.<br><br>ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 43 වන වගන්තිය මගින්, කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් නිලධරයන් හා සේවකයින් පත් කරනු ලැබිය හැකි අතර පත් කරන ලද නිලධරයන්ට හා සේවකයින්ට කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කරනු ලබන ආකාරයට හා අනුප්‍රමාණ අනුව වැටුප් ගෙවිය යුතු බවට ප්‍රතිපාදන සලසා ඇත.<br><br>විශේෂිත පුහුණු කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ හා රඳවා ගැනීමේ අවශ්‍යතාවය අනුව, 1992 මාර්තු මාසයේදී එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් රජයේ | පොදු ව්‍යාපාර කාරක සභාවේ රැස්වීමේ නිර්දේශයට අනුව සිය කාර්ය මණ්ඩලයට ලබා දෙන වැටුප් හා දීමනා සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | දීමනා සම්බන්ධයෙන් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකඟතාවය ලබා ගත යුතුය. කොමිෂන් සභාව විසින් 2019 අගෝස්තු 22 දක්වාත් එවැනි එකඟතාවයක් ලබාගෙන නොතිබුණි. තවද, 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2018 අනුව, අදාළ බලධාරීන් විසින් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සේවකයින් බඳවා ගැනීමෙන් සහ සේවකයින්ගේ වැටුප් හා දීමනා වැඩි කිරීමෙන් වැලකී සිටිය යුතුය. | රෙගුලාසි සලකා බැලීමෙන් තොරව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ වැටුප් හා අනෙකුත් දීමනා නියම කිරීමට කොමිෂන් සභාවට හැකි බව දන්වා තිබුණි. | |
| ආ | 2017 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 96 ක් වූ අතර මෙම කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. 2018 ජනවාරි 22 දින පැවති 404 වැනි කොමිෂන් සභා රැස්වීමේදී, කොමිෂන් සභාවේ වේතන කමිටුවේ තීරණ එනම් "භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 1992 මාර්තු 31 දිනැති විධානයට අනුව, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට නිදහස තිබේ නම් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සංයුතිය කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තීරණය කළ යුතු බව සහ අතීතයේ දී අනුගමනය කළ පරිදිම අනුමැතිය ලබා ගැනීම කොමිෂන් සභාව විසින් නතර කළ යුතු බව පැහැදිලි වේ. " යන්න කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අනුමත කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය 96 සිට | 2017 වර්ෂය තුළ කරන ලද මූලික ඉල්ලීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ප්‍රතිචාර නොදැක්වූ හෙයින්, කොමිෂන් සභා පනත සහ 1992 මාර්තු 31 දිනැති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද විධානය මත පදනම්ව කාර්ය මණ්ඩල සංශෝධනය, කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් අනුමත කර තිබුණි. | වැඩි කරන ලද 41 ක් වූ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | 137 දක්වා වැඩි කර තිබුණි.<br>කෙසේ වෙතත්, වැඩි කරන ලද 41 ක් වූ කාර්ය මණ්ඩලය සඳහා ඉහත සඳහන් 2018 ජූලි 18 දිනැති චක්‍රලේඛ අංක 03 / 2018 හි සඳහන් පරිදි, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | | |
| ඇ | 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට අයත් ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන අධ්‍යක්ෂක, විමර්ෂණ අධ්‍යක්ෂක, මානව සම්පත් අධ්‍යක්ෂක සහ ප්‍රාග්ධන වෙළඳපොල අධ්‍යාපන හා පුහුණු අධ්‍යක්ෂක යන තනතුරු 2019 අගෝස්තු 22 දිනට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු වූ තනතුරු කිහිප වතාවක්ම ප්‍රචාරය කරන ලදී. සුදුසු අපේක්ෂකයින් හඳුනාගෙන නොමැත. | විමර්ශන අධ්‍යක්ෂක වැනි අත්‍යවශ්‍ය තනතුරු පිරවීමට ප්‍රමුඛතාවය ලබා දීම. |
| ඇ | 2016 අප්‍රේල් 19 දින සිට බලපැවැත්වෙන පරිදි කොමිෂන් සභාවේ එක් නිලධාරියෙකුගේ සේවය තහනම් කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 31.11 උප වගන්තියට පටහැනිව වාහන දීමනාව හා අනෙකුත් ප්‍රතිලාභ හැර මාසික දළ වැටුපෙන් හරි අඩකට සමාන මුදලක් ගෙවීම් කර තිබුණි. 2016 අප්‍රේල් 20 සිට 2018 අගෝස්තු 31 දක්වා කොමිෂන් සභාව විසින් දරන ලද අර්ධ මාසික වැටුප් වියදම රුපියල් 5,212,815 ක් විය.<br>2018 සැප්තැම්බර් 18 දිනැති පොදු ව්‍යාපාර කාරක සභාවේ (කෝප්) රැස්වීමේ නිර්දේශයට අනුව, කොමිෂන් සභාව වැටුප් ගෙවීම නැවැත්විය යුතු අතර ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමට කටයුතු කළ යුතුය. ඒ අනුව, 2018 සැප්තැම්බර් මස සිට | ඔහුට ගෙවන ලද අර්ධ වැටුප් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීමට පියවර ගනු ලැබේ. | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය අනුව ගෙවන ලද මුළු වැටුප අය කර ගැනීමට කටයුතු කිරීම. |

බලපැවැත්වෙන පරිදි අර්ධ මාසික වැටුප ගෙවීම නවතා තිබු අතර ඉහත සඳහන් මුදල ආපසු ගෙවන ලෙස 2018 නොවැම්බර් 15 දිනැති ලිපියෙන් නිලධාරියාට දන්වන ලදී. කෙසේ වෙතත්, 2019 අගෝස්තු 22 දක්වා කොමිෂන් සභාව විසින් එය අය කරගෙන නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අයිතම් 15 ක අයවැය වියදම හා තථ්‍ය වියදම අතර සියයට 37 සිට සියයට 96 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය. | අයිතම 15 න් වියදම් අයිතම 12 ක මුළු වටිනාකම රු. මිලියන 9.4 ක් (අයවැය) සහ රු. මිලියන 4.1 ක් (තථ්‍ය) වේ. එම වියදම්වල ප්‍රමාණය ඉතා අඩු වුවත් ප්‍රතිශතමය විචලායයන් ප්‍රමාණාත්මක වේ. | අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගැනීම. |